**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක** **2023 ජනවාරි 23**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 දෙසැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 59.2%ක් බව එහි වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 65.0%ක් ලෙස වාර්තා විය. 2022 දෙසැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 29.5%ක හා ආහාර නොවන කාණ්ඩයේ 29.6%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 දෙසැම්බර් මාසයේ 14.0%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 10.0%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 4.0%ක් විය. 2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. කෙසේ වෙතත්, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය (ලක්ෂ්‍යමය) 2022 නොවැම්බර් මාසයේදී 69.8% සිට 2022 දෙසැම්බර් මාසයේදී 59.3% දක්වා අඩු වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) ද 2022 නොවැම්බර් මාසයේදී 60.4% සිට 2022 දෙසැම්බර් මාසයේදී 59.0% දක්වා අඩු විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 නොවැම්බර් මාසයේ 256.3ක් වූ දර්ශකාංකය 2022 දෙසැම්බර් මාසයේ දී ද නොවෙනස්ව පැවති බව වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම 0.20% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩයේ වියදම 0.21% කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට ලොකුළූණු, කරවල, සීනි, එළවළු, හාල්, තිරිඟුපිටි, පාන්, දෙහි, මයිසූර් පරිප්පු සහ අර්තාපල් යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් පොල්, කිරිපිටි, අළුත් පළතුරු, තේ කොළ/කුඩු, පොල්තෙල්, බිත්තර, රතුළූණු සහ කුකුල්මස් යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 දෙසැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' (*බලශක්ති පිරිමැසුම් බල්බ*), 'ප්‍රවාහන' (වාහන බලපත්‍ර ගාස්තු), 'විනෝදාත්මක හා සංස්කෘතික' (*පොත්*), 'ආපනශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' (*සුවඳ සබන් වර්ග*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*බුලත්, පුවක්*) සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*ගොඩනැගිලි ද්‍රව්‍ය*)' යන කාණ්ඩවල අයිතමයන්ගේ මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත. එමෙන්ම 'සෞඛ්‍ය' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇති අතර, 'සන්නිවේදන' හා 'අධ්‍යාපන' යන කාණ්ඩ වලට අයත් අයිතමයන්ගේ මිල දෙසැම්බර් මාසය පුරා නොවෙනස්ව පැවති බව වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 නොවැම්බර් මාසයේ 60.1% සිට 2022 දෙසැම්බර් මාසයේ 57.5% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |
| | අප්‍රේල් | 190.3 | 218.8 | 167.9 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 45.1 | 23.9 | 27.9 |
| | මැයි | 208.7 | 242.2 | 182.4 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 58.0 | 34.2 | 37.7 |
| | ජූනි | 231.5 | 276.6 | 196.0 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 75.8 | 43.6 | 49.3 |
| | ජූලි | 244.4 | 289.3 | 209.1 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 82.5 | 52.4 | 57.3 |
| | අගෝ. | 250.4 | 294.3 | 215.8 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 84.6 | 57.1 | 60.5 |
| | සැප්. | 256.2 | 296.5 | 224.5 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 85.8 | 62.8 | 64.1 |
| | ඔක්. | 256.9 | 294.1 | 227.7 | 244.6 | 0.3 | 1.3 | 70.6 | 80.9 | 61.3 | 62.4 |
| | නොවැ. | 256.3 | 291.2 | 228.7 | 244.9 | -0.2 | 0.1 | 65.0 | 69.8 | 60.4 | 60.1 |
| | දෙසැ. | 256.3 | 290.0 | 229.7 | 245.2 | 0.0 | 0.1 | 59.2 | 59.3 | 59.0 | 57.5 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව